අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු

**G. C. E. (Adv. Level) Examination, August 2011**

# කෘෂි විද්‍යාව I - පැය දෙකයි

# Agricultural Science I - Two hours

උපදෙස්:
- ¤ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ¤ ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- ¤ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- ¤ උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ¤ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

---

1. කාබනික ද්‍රව්‍ය ප්‍රමාණවත් තරම් අඩංගු වූ පාංශු පැතිකඩක මතුපිට කලාපවල ව්‍යුහය
(1) කණිකාමය වේ. (2) කුට්ටිමය වේ. (3) තැටිමය වේ.
(4) ස්ථම්භාකාර වේ. (5) ප්‍රිස්මාකාර වේ.

2. වගා කන්නයෙන් පසු සහ පස මත බර වාහන ගමනාගමනයෙන් පසු නොවෙනස් ව පවත්නා පාංශු ගුණාංගය වනුයේ,
(1) ව්‍යුහය වේ. (2) දෘෂ්‍ය ඝනත්වය වේ. (3) සිදුරු අවකාශය වේ.
(4) සත්‍ය ඝනත්වය වේ. (5) පාංශු සමූහනවල ප්‍රමාණය වේ.

3. 'පාරිභෝගික ජල භාවිතාව' යනු,
(1) ශාක පටකවල රැඳී ඇති ජලය ප්‍රමාණය වේ.
(2) පස මතුපිටින් වාෂ්පීකරණය වන ජලය ප්‍රමාණය වේ.
(3) ශාකවලින් උත්ස්වේදනය වන ජලය ප්‍රමාණය වේ.
(4) පස හා ශාකවලින් වාෂ්පීකරණය හා උත්ස්වේදනය වන ජලය ප්‍රමාණය වේ.
(5) පස තුළට අවශෝෂණය වන ජලය ප්‍රමාණය වේ.

4. පොදුවේ සැලකූ විට අධිපීඩන පද්ධති හා අවපීඩන පද්ධති පිළිවෙළින්,
(1) 'යහපත්' හා 'කුණාටු සහිත' කාලගුණික තත්ත්ව හා සම්බන්ධ ය.
(2) 'කුණාටු සහිත' හා 'යහපත්' කාලගුණික තත්ත්ව හා සම්බන්ධ ය.
(3) 'සුළං සහිත' හා 'සෞම්‍ය" කාලගුණික තත්ත්ව හා සම්බන්ධ ය.
(4) සෞම්‍ය' හා 'සුළං සහිත' කාලගුණික තත්ත්ව හා සම්බන්ධ ය.
(5) 'වර්ෂා සහිත' හා 'වියළි' කාලගුණික තත්ත්ව හා සම්බන්ධ ය.

5. පහත වාරි ජල සම්පාදන ක්‍රම අතුරෙන් ඉහළ ම ජල සංරක්ෂණයක් වාර්තා වී ඇත්තේ,
(1) පිටාර (flood) ජල සම්පාදනයේ ය. (2) ඇළි (furrow) ජල සම්පාදනයේ ය.
(3) විසිරි ජල (sprinkler) සම්පාදනයේ ය. (4) බිංදු (drip) ජල සම්පාදනයේ ය.
(5) මිහිදුම් (mist) ජල සම්පාදනයේ ය.

6. විෂමයෝගී පෞද්ගලිකයන් (RrYy) දෙදෙනෙකුගේ ද්විමුහුමකින් ලැබෙන රූපානුදර්ශ අනුපාතය වනුයේ,
(1) 1:1 (2) 3:1 (3) 9:7 (4) 1:1:1:1 (5) 9:3:3:1

7. අන්තඃජනිත ජෛව රසායනිකයක් ශාකයක් තුළ ඇති විට ශාකයේ සෛල විභාජනය හා සෛල දික්වීම වැඩි කරන අතර, පත්‍ර, මල් හා ඵල වර්ධනය ද වැඩි කරයි. තවද එමගින් සුප්තතාව බිඳ දමන අතර පුෂ්පීකරණය ආරම්භ කරයි. මෙම ද්‍රව්‍යය
(1) ගිබෙරිලින් විය හැකිය. (2) ඔක්සින් විය හැකිය.
(3) එතිලීන් විය හැකිය. (4) ඇබ්සෙසික් අම්ලය විය හැකිය.
(5) සයිටොකයිනින් විය හැකිය.

8. ජල වහනය මගින් පසේ,
(1) වයනය දියුණු කෙරේ. (2) ව්‍යුහය දියුණු කෙරේ.
(3) ඔක්සිජන් මට්ටම දියුණු කෙරේ. (4) පෝෂණ සුලබතාව දියුණු කෙරේ.
(5) භෂ්ම සංතෘප්තිය දියුණු කෙරේ.

9. කෙටි කාලාන්තරවලින් යුත් සාමාන්‍ය ප්‍රමාණයේ ජල සම්පාදනයක් අවශ්‍ය වන්නේ ක්ෂේත්‍ර බෝග
(1) රොන් මඩ සහිත මැටි පසේ වගා කර ඇති විට ය.
(2) මැටි සහිත ලෝම පසේ වගා කර ඇති විට ය.
(3) රොන්මඩ සහිත ලෝම පසේ වගා කර ඇති විට ය.
(4) ලෝම සහිත වැලි පසේ වගා කර ඇති විට ය.
(5) වැලි සහිත මැටි පසේ වගා කර ඇති විට ය.

10. පළිබෝධ නාශක විවිධ ආකාරවලින් (formulations) දක්නට ලැබෙන අතර තෛලෝදකෘත සාන්ද්‍රණ (Emulsifiable Concentrates (EC)) යනු ඉන් එක් ආකාරයකි. වෙළඳපොලෙහි EC දැකිය හැක්කේ,
(1) කුඩු වශයෙනි. (2) දියර වශයෙනි. (3) කණිකා වශයෙනි.
(4) තෙත් කළ හැකි කුඩු වශයෙනි. (5) කුට්ටි වශයෙනි.

11. ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණයේ දී,
(1) ශාකසාර පමණක් භාවිතයට ඉඩ දේ.
(2) තුන්වන පරම්පරාවේ පළිබෝධනාශක පමණක් භාවිතයට ඉඩ දේ.
(3) ඕර්ගනෝ පොස්පේට් පමණක් භාවිතයට ඉඩ දේ.
(4) පළිබෝධනාශක භාවිතයට ඉඩ නොදේ.
(5) අවශ්‍යම අවස්ථාවක පමණක් පළිබෝධ නාශක භාවිතයට ඉඩ දේ.

12. බීජ බැංකු වැදගත් වන්නේ,
(1) සංවර්ධනය වන රටවල මුදල් තැන්පත් කිරීමට ය.
(2) ඒක බෝග නිෂ්පාදනය ආරක්ෂා කිරීමට ය.
(3) ප්‍රවේණික විවිධත්වය ආරක්ෂා කිරීමට ය.
(4) සංවර්ධනය වන රටවලට ණය ලබා දීමට ය.
(5) ගොවීන්ට ජාන විකරණය කළ බෝග ලබා දීමට ය.

13. ශාකයෙන් ශාකයට රෝග කාරකයන් රැගෙන යන්නේ
(1) ව්‍යාධිජනකයින් ය. (2) පරපෝෂිතයින් ය. (3) විලෝපිකයින් ය.
(4) වාහකයින් ය. (5) පළිබෝධ ය.

14. පලතුරු පසු අස්වනු තාක්ෂණයේදී, වායු හෝ දියර ආකාරයෙන් එතිලීන් යොදා ගන්නේ,
(1) ගබඩා කාලය දීර්ඝ කිරීමට ය.
(2) පලතුරු ඉදවීමට ය.
(3) පළිබෝධ හා රෝගවලින් ආරක්ෂා කිරීමට ය.
(4) නිෂ්පාදිතයෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීමට ය.
(5) රසය වැඩි කිරීමට ය.

15. ඒගාර් යනු,
(1) පෝෂකයකි. (2) විටමිනයකි. (3) ඝනී කාරකයකි.
(4) හෝර්මෝනයකි. (5) අපූතිකාරකයකි.

16. කිණකවල ප්‍රරෝහ ඇති කිරීම සඳහා පටක රෝපණ මාධ්‍යයක භාවිත කරනු ලබන ද්‍රව්‍යය වනුයේ,
(1) ABA ය. (2) GA3 ය. (3) IBA ය.
(4) කයිනටින් ය. (5) ඒගාර් ය.

17. අභිජනන බීජවල ප්‍රජනිතය වන්නා වූද, ඉහළ ප්‍රවේණික අනන්‍යතාවකින් හා පාරිශුද්ධ බවකින් යුක්ත වූද, බීජ පංතිය
(1) ජාන විකරණය කළ බීජ වේ. (2) සහතික කළ බීජ වේ. (3) පදනම් බීජ වේ.
(4) ලියාපදිංචි බීජ වේ. (5) දෙමුහුම් බීජ වේ.

18. ගොවියෙක් වාණිජ තවානකින් මිලදී ගත් මිරිස් පැළ කිහිපයක් ඔහුගේ ගෙවත්තේ වගා කළේය. සති කිහිපයකට පසු පැරණි පත්‍ර කහ පැහැ ගැන් වී ඇති අතර අලුත් පත්‍ර කොළ පැහැයෙන් හා නීරෝගීව පවතින බව ඔහු විසින් නිරීක්ෂණය කරන ලදී. මෙයට වඩාත්ම බලපෑ හැකි හේතුව වනුයේ,
(1) පැළ, පසේ වඩාත් ගැඹුරට සිටුවීමයි. (2) පැළ, පසේ වඩාත් මතුපිට සිටුවීමයි.
(3) නයිට්‍රජන් ඌනතාවයි. (4) පොස්ෆේට් ඌනතාවයි.
(5) කැල්සියම් ඌනතාවයි.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

19. එක්තරා පුද්ගලයෙක් ඔහු මිලදී ගත් මුදවපු කිරි හට්ටි තුනෙන් එකක් එළකිරිවලින් නිපදවා ඇති බව දැන ගත්තේ ය. ඔහුගේ නිරීක්ෂණයට හේතු විය හැක්කේ,
(1) මුදවපු එළකිරි සුදු පැහැවන අතර, ඝනබව අඩුවීම ය.
(2) මුදවපු එළකිරි කහ පැහැවන අතර වඩාත් ඝනබවෙන් යුතුවීම ය.
(3) මුදවපු මී කිරි සුදු පැහැවන අතර වඩාත් ඝනබවෙන් යුතුවීම ය.
(4) මුදවපු මී කිරි කහ පැහැ වන අතර, ඝනබවෙන් අඩුවීම ය.
(5) වර්ග දෙකෙහිම මුදවපු කිරි සුදු පැහැති නමුත් මුදවපු මී කිරි වඩාත් ඝනබවෙන් යුතුවීම ය.

20. 'කිරි උණ'
(1) බැක්ටීරියානු රෝගයකි. (2) වයිරස ආසාදනයකි. (3) පරිවෘත්තීය රෝගයකි.
(4) විටමින ඌනතාවකි. (5) ඛනිජ ඌනතාවකි.

21. ශ්‍රී ලංකාවේ කිරි ගව නිෂ්පාදනය සඳහා ඇති විභව්‍යතා කිහිපයක් වනුයේ,
(1) ස්වභාවික තණ බිම් පැවතීම, විශාල වශයෙන් දේශීය ගව රංචු සිටීම හා කෘත්‍රිම සිංචන පහසුකම් නොමැති වීම ය.
(2) උචිත රාජ්‍ය ප්‍රතිපත්ති, කිරි නිෂ්පාදන සඳහා විශාල ඉල්ලුමක් පැවතීම හා කිරි සඳහා හොඳ මිලක් තිබීම ය.
(3) පෞද්ගලික අංශයේ ආයෝජන, යාන්ත්‍රිකරණ පහසුකම් වැඩිවීම හා අසීමිත ඉඩම් ප්‍රමාණයක් තිබීම ය.
(4) පහසුවෙන් ලබා ගත හැකි ශ්‍රමය, අභිජනන සතුන් සිටීම හා වැඩිදියුණු කරන ලද තෘණ බිම් සුලභව තිබීම ය.
(5) ඉහළ ගුණාත්මයෙන් යුත් සත්ත්වාහාර, වැඩි දියුණු කළ කිරි එකතු කිරීමේ ජාලය, සැකසීමේ පහසුකම් තිබීම හා විශාල ලෙස කිරිපිටි ආනයනය කිරීම ය.

22. රසායනික (එන්සයිමීය) ජීර්ණය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ,
(1) විතංශිකාව, ග්‍රහණිය හා මහාන්ත්‍රය තුළ ය.
(2) බහුනැමිය, ආමාශය හා කුඩා අන්ත්‍රය තුළ ය.
(3) බහුනැමිය, ග්‍රහණිය හා කුඩා අන්ත්‍රය තුළ ය.
(4) පූර්වාමාශය, ශේෂාන්ත්‍රකය හා වටනය තුළ ය.
(5) ආමාශය, ග්‍රහණිය හා උණ්ඩුකය තුළ ය.

23. මුල් කිරි,
(1) යනු ක්ෂීරණයේ ප්‍රථම සති දෙකේ දී දෙනකගෙන් ලැබෙන කිරි වේ.
(2) වැඩිපුර ඝනද්‍රව්‍ය අඩංගු වන බැවින් සාමාන්‍ය කිරිවලට වඩා ඝනකමින් යුක්ත ය.
(3) ජීර්ණය අපහසු වන බැවින් රෝගී සතුන්ට නොදිය යුතු ය.
(4) ප්‍රධාන වශයෙන් බුරුළු ප්‍රදාහය (Mastitis) ආසාදිත දෙනුන්ගේ දැකිය හැකි ය.
(5) පැටියා කිරි බීමට පෙර ඉවත් කළ යුතු ය.

24. පෙරකිරි පරීක්ෂාව (Strip Cup test) යොදා ගනුයේ,
(1) කිරිවල ඇති මේද ප්‍රමාණය පරීක්ෂා කිරීමට ය.
(2) එළදෙන යම් රෝගයකින් පෙළේ දැයි දැන ගැනීමට ය.
(3) බුරුල්ලට මැස්ටයිටීස් ආසාදනය වී ඇත්දැ'යි දැන ගැනීමට ය.
(4) තනපුඩුවල තත්ත්වය පරීක්ෂා කිරීමට ය.
(5) කිරිවල ඇති SNF ප්‍රමාණය දැන ගැනීමට ය.

25. මෝල්ඩ් බෝර්ඩ් නගුල ප්‍රධාන වශයෙන් භාවිත කරන්නේ.
(1) ප්‍රාථමික බිම් සැකසුම් උපකරණයක් ලෙස ය.
(2) ද්විතීයික බිම් සැකසුම් උපකරණයක් ලෙස ය.
(3) මට්ටම් කිරීමේ උපකරණයක් ලෙස ය.
(4) මිනිස් ශ්‍රමයෙන් ක්‍රියාකරන උපකරණයක් ලෙස ය.
(5) සත්ත්ව ශ්‍රමයෙන් ක්‍රියාකරන උපකරණයක් ලෙස ය.

26. වී වගාව සඳහා බිම් සැකසීමේ දී පසේ ව්‍යුහය
(1) වෙනස් නොවේ. (2) වැඩි දියුණු වේ. (3) විනාශ වේ.
(4) සුසංහනය වේ. (5) අඩු වේ.

27. ගෙවතු වගා කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ,
   (1) ගෘහණියට අමතර ආදායමක් ලබා ගැනීම ය.
   (2) පවුලට පළිබෝධනාශක රහිත ආහාර ලබා ගැනීම ය.
   (3) භූමිය කාර්යක්ෂමව භාවිත කිරීම ය.
   (4) ගෙවත්ත තුළ ජෛව විවිධත්වය පවත්වා ගැනීම ය.
   (5) පවුලට පෝෂණය ලබා දීම ය.

28. පලතුරු හා එළවලු පරිරක්ෂණයේදී, සුබ්‍රිකරණය සිදු කරනුයේ,
   (1) එන්සයිම අක්‍රිය කිරීමට ය.
   (2) ක්ෂුද්‍ර ජීවීන් අක්‍රිය කිරීමට ය.
   (3) රසායනික ක්‍රියා උත්තේජනය කිරීමට ය.
   (4) භෞතික හානි අවම කිරීමට ය.
   (5) ද්‍රව්‍යය මෘදු කිරීමට ය.


29. ආහාර අධිශීත ගබඩා කිරීමේ දී,
   (1) ක්ෂුද්‍ර ජීවීන් විනාශ වේ.
   (2) ක්ෂුද්‍ර ජීවීන් හා ඔවුන්ගේ බීජාණු යන දෙකම විනාශ වේ.
   (3) ක්ෂුද්‍ර ජීවීන් හා ඔවුන්ගේ බීජාණු අක්‍රිය වේ.
   (4) ක්ෂුද්‍ර ජීවීන් නිකුත් කරන විෂ වර්ග විනාශ වේ.
   (5) ක්ෂුද්‍ර ජීවී එන්සයිම සදහටම අක්‍රිය වේ.

30. දේශගුණය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.
   A - යම් ස්ථානයක දේශගුණය මගින් එම ස්ථානයේ වගා කළ හැකි බෝග වර්ගය නිර්ණය කෙරේ.
   B - කාලගුණය මගින් බෝගයේ වර්ධක අවධිවලට බලපෑම් කෙරේ.

   ඉහත ප්‍රකාශ අතුරෙන්
   (1) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර B මගින් A පැහැදිලි කෙරේ.
   (2) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර බෝග වර්ධනය කෙරෙහි බලපෑම පැහැදිලි කෙරේ.
   (3) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන නමුත් බෝග අස්වැන්න කෙරෙහි බලපෑමක් නැත.
   (4) A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වන අතර බෝග වර්ධනය කෙරෙහි බලපෑම පැහැදිලි නොකරයි.
   (5) A ප්‍රකාශය සත්‍ය වන අතර එමගින් කෘෂිකර්මය මත ඇති කෙරෙන බලපෑම විස්තර වන නමුත් B ප්‍රකාශය අසත්‍ය ය.

• ප්‍රශ්න අංක 31 හා 32 ට පිළිතුරු දීම සඳහා පහත රූපසටහන භාවිත කරන්න.

| | | |
|---|---|---|
| Light | - | ආලෝකය |
| Heat | - | තාපය |
| Mechanical support | - | යාන්ත්‍රික උපකාරය |
| Organic matter | - | කාබනික ද්‍රව්‍ය |
| Nitrogen | - | නයිට්‍රජන් |
| Potassium | - | පොටෑසියම් |
| Phosphorus | - | පොස්පරස් |
| Other nutrients | - | අනෙකුත් පෝෂක |
| Water | - | ජලය |
| Air | - | වාතය |




A B

31. ඉහත රූප සටහනට අනුව,
   (1) A හා B පස්වල පිළිවෙලින් නයිට්‍රජන් හා පොටෑසියම් අතිරික්ත ප්‍රමාණවලින් ඇත.
   (2) A හා B පස් වර්ග දෙකෙහිම ප්‍රමාණවත් තරම් ආලෝකය, යාන්ත්‍රික උපකාරය හා වාතය නැත.
   (3) A හා B පස්වල සීමාකාරී සාධක පිළිවෙලින් නයිට්‍රජන් හා පොටෑසියම් වේ.
   (4) A හා B පස් වර්ග දෙකෙහිම N, P, K. සීමාකාරී සාධක බවට පත් ව ඇත.
   (5) A පසෙහි ජල ප්‍රමාණය B පසට සාපේක්ෂව අඩු ප්‍රමාණයක පවතී.

32. ඉහත රූප සටහනෙහි පැහැදිලි වනුයේ,
   (1) නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ නියමය වේ.
   (2) මෙන්ඩල්ගේ ප්‍රවේණික නියමය වේ.
   (3) ලිබිග් ගේ අවමය පිළිබඳ නියමය වේ.
   (4) නිව්ටන්ගේ චලනය පිළිබඳ නියමය වේ.
   (5) ආකිමිඩීස්ගේ ඉපිලුම් නියමය වේ.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

33. කාබනික පොහොර භාවිතයේ ප්‍රතිලාභයක් වනුයේ,
(1) පසේ ජලය රඳා ගැනීමේ ධාරිතාව වැඩි දියුණු වීම ය.
(2) පසට අවශ්‍ය පමණ නයිට්‍රජන් ලබා දීම ය.
(3) ශාක පෝෂක ඉක්මනින් පාංශු ජලයට නිදහස් කිරීම ය.
(4) පසට අවශ්‍ය පමණ පොස්පරස් ලබා දීම ය.
(5) පසෙහි pH අගය 7 ඉක්මවා වැඩි කිරීම ය.

34. හේන් ගොවිතැන
(1) වනාන්තර හා තෘණ භූමි විශාල වශයෙන් විනාශ කරයි.
(2) අඩු ගහන ඝනත්වයෙන් යුත් ජනතාවකට උපකාරී නොවේ.
(3) යනු භූමිය අඛණ්ඩව වගා කරන ක්‍රමයකි.
(4) මිශ්‍ර බෝග වගාවට උදාහරණයක් ලෙස සැලකිය හැකිය.
(5) දේශගුණික විපර්යාසවලට බලපෑමක් නොකරයි.

- ප්‍රශ්න අංක 35 ට පිළිතුරු දීම සඳහා පහත රූපසටහන භාවිත කරන්න.




35. ඉහත වගා ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණය වනුයේ,
(1) ලාභදායී වීම හා කළමනාකරණය පහසු වීම ය.
(2) වැඩෙන ශාක සඳහා ජලය හා පෝෂක පමණක් භාවිත කිරීම ය.
(3) පසේ වයනය හා ව්‍යූහය දියුණු කරන ශාක නිෂ්පාදනය කිරීම ය.
(4) රෝග, පළිබෝධ හා වල් පැළෑටි ආසාදනයෙන් තොර වීම ය.
(5) පත්‍රමය එළවලු නිෂ්පාදනය සඳහා පමණක් යොදා ගැනීම ය.

36. කෘෂිකර්මයේ දී ඉවක් බවක් නැතිව පළිබෝධ නාශක භාවිතයෙන්
A - පළිබෝධ ප්‍රතිරෝධීතාව (resistance) ඇති වේ.
B - පළිබෝධ නැවත ඇතිවීම (resurgence) සිදු වේ.
C - පරිසර දූෂණය සිදු වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C සියල්ලම.

37. වල් පැළෑටියක් නිරීක්ෂණය කළ ශිෂ්‍යයෙක් එහි ලක්ෂණ පහත පරිදි වාර්තා කළේ ය.
- පටු සිරස්ව වැඩුනු පත්‍ර ඇත.
- පත්‍රය දිගටම පිහිටා ඇති සමාන්තර නාරටි ඇත.
- ප්‍රරෝහණයේදී එක් පත්‍රයක් පමණක් දක්නට ලැබේ.
- තන්තුමය මූල පද්ධතියක් ඇත.

මෙම වල් පැළෑටිය,
(1) *Acalypha indica* (කුප්පමේනිය) වේ. (2) *Aerva lanata* (පොල්පලා) වේ.
(3) *Amaranthus viridis* (කූර තම්පලා) වේ. (4) *Crotalaria juncea* (අඬන හිරියා) වේ.
(5) *Axonopus compressus* (පොල් තණ) වේ.


38. කළු පැහැති පොලිතීන්වලින් පසට වසුනක් යෙදීමෙන්,

A - පස උණුසුම් වීම නිසා කලින් අස්වනු ලැබීමට හේතු වේ.
B - උචිත පරිසර තත්ත්වයන් ලැබීම නිසා පළිබෝධ ආසාදන වැඩි වේ.
C - අයහපත් වර්ධන තත්ත්වයක් ලැබීම නිසා වල් පැළෑටි වර්ධනය අඩු වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) A හා C පමණි.

• ප්‍රශ්න අංක 39 හා 40 ට පිළිතුරු දීම සඳහා පහත රූපසටහන භාවිතා කරන්න.




clay - මැටි
sandy clay - වැලිමය මැටි
clay loam - මැටි ලෝම
silty clay - රොන්මඩ මැටි
silty clay loam - රොන් මඩ මැටි ලෝම
sandy clay loam - වැලිමය මැටි ලෝම
loam - ලෝම
silt loam - රොන්මඩ ලෝම
sand - වැලි
loamy sand - ලෝම වැලි
sandy loam - වැලිමය ලෝම
silt - රොන්මඩ

39. මෙම රූපසටහනේ A ලක්ෂ්‍යයෙහි පසෙහි වයනය වූයේ,

(1) වැලි 20% ලෝම 70% මැටි 10% (2) වැලි 10% ලෝම 70% මැටි 20%
(3) වැලි 70% ලෝම 10% මැටි 20% (4) වැලි 10% ලෝම 20% මැටි 70%
(5) වැලි 30% ලෝම 50% මැටි 20%

40. වැලි 55% ලෝම 20% මැටි 25% වූ පාංශු නියැදියක වයන පංතිය වනුයේ,

(1) වැලිමය මැටි (2) වැලිමය ලෝම (3) ලෝම වැලි
(4) රොන්මඩ සහිත මැටි ලෝම (5) වැලිමය මැටි ලෝම

41. මිලෙහි 10% ක වැඩිවීමක්, ඉල්ලුම් ප්‍රමාණයෙහි 15% ක අඩු වීමට හේතු වන්නේ නම්, ඉල්ලුමෙහි මිල නම්‍යතාව (Price elasticity) වනුයේ,

(1) 10 ÷ 15 = 0.67 (2) 15 ÷ 10 = 1.50 (3) 15 - 10 = 5
(4) 15 + 10 = 25 (5) 10 × 15 = 150

42. භාණ්ඩ දෙකක හරස් මිල නම්‍යතාව (Cross price elasticity) ධන නම්, මෙම භාණ්ඩ දෙක

(1) අනුපූරක භාණ්ඩ වේ. (2) ආදේශක භාණ්ඩ වේ.
(3) අත්‍යවශ්‍ය භාණ්ඩ වේ. (4) බාල භාණ්ඩ වේ.
(5) සුඛෝපභෝගී භාණ්ඩ වේ.

43. ආන්තික පිරිවැය යනු,

(1) මුළු පිරිවැය, මුළු නිපැයුමෙන් බෙදූ විට ලැබෙන අගය වේ.
(2) නිෂ්පාදිතය එක් ඒකකයක් වැඩි කිරීමට වැය වන අතිරේක පිරිවැය වේ.
(3) සාමාන්‍ය පිරිවැයේ වෙනස වේ.
(4) සාමාන්‍ය පිරිවැය, මුළු යෙදවුමෙන් බෙදූ විට ලැබෙන අගය වේ.
(5) මුළු පිරිවැය, මුළු යෙදවුම්වලින් බෙදූ විට ලැබෙන අගය වේ.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

44. වෙළඳපළ අතිරික්තයක් ඇති වනුයේ,
(1) වෙළඳපළ ඉල්ලුම සැපයුමට වඩා වැඩි වන විට ය.
(2) වෙළඳපළ සැපයුම ඉල්ලුමට වඩා වැඩි වන විට ය.
(3) ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වූ විට ය.
(4) ඉල්ලුම් වක්‍රය වමට විතැන් වූ විට ය.
(5) සැපයුම් වක්‍රය වමට විතැන් වූ විට ය.

45. රනිකට්, සැල්මොනෙල්ලා හා කොක්සිඩියෝසිස් රෝග වැළැක්වීම සඳහා වඩාත් ඵලදායී ක්‍රියාමාර්ග වනුයේ,
(1) සතුන් එන්නත් කිරීම, ප්‍රතිජීවක සැපයීම හා හොඳ සනීපාරක්ෂක තත්ත්ව පවත්වාගෙන යාම වේ.
(2) සතුන් එන්නත් කිරීම, කුඩු තුළ සතුන් ඇති කිරීම හා ජෛව ආරක්‍ෂණ ක්‍රම යොදා ගැනීම වේ.
(3) අතුරණුව හොඳ තත්ත්වයෙන් පවත්වා ගැනීම, ප්‍රතිජීවක ලබා දීම හා අමුත්තන් ඇතුළු වීම වැළැක්වීම වේ.
(4) සතුන් එන්නත් කිරීම, ප්‍රතිරෝධී වර්ග අභිජනනය කිරීම හා යහපත් කළමනාකරණ පිළිවෙත් පවත්වාගෙන යාම වේ.
(5) ප්‍රතිජීවක ලබා දීම, අතුරණුව මාරු කිරීම හා රෝගී සතුන් පිටලෑම වේ.

46. කුකුළන් පිටලෑම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - බ්‍රොයිලර් සතුන් කෙටි කාලයක් තබා ගන්නා බැවින් බිත්තර නිෂ්පාදනයේදීට වඩා බ්‍රොයිලර් නිෂ්පාදනයේදී පිටලෑම වඩාත් වැදගත් වේ.
B - ඒකාකාරී සතුන් රැලක් පවත්වා ගැනීම සඳහා පිටලෑම අවශ්‍යතාවක් වන බැවින් එය නොකඩවා සිදු කළ යුතු කටයුත්තකි.
C - පිටලෑමේ ප්‍රතිඵලයක් වශයෙන් ගොවිපල සම්පත් හා යෙදවුම් කාර්යක්‍ෂම ලෙස භාවිතයට ඉඩ සැලසේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C සියල්ලම ය.

47. ගොවිපළ සතුන් කෙරෙහි දේශගුණික සාධකවල බලපෑම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - ඉහළ උෂ්ණත්වය සමග පවතින ඉහළ සාපේක්‍ෂ ආර්ද්‍රතාව කිරි දෙනුන්ගේ කිරි අස්වැන්න අඩු කරයි.
B - ඉහළ උෂ්ණත්වය, බිත්තර දමන කිකිළියන්ගේ බිත්තර නිෂ්පාදනය අඩු කරන නමුත් එයට සූර්යාලෝකයේ බලපෑමක් නැත.
C - ගවයන් හා කුකුළන්, අඩු උෂ්ණත්වයේදී, වැඩි උෂ්ණත්වයේදීට වඩා සක්‍රිය බවක් පෙන්වයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C සියල්ලම ය.

48. ප්‍රාථමික බිම් සැකසීමේ ප්‍රධාන අරමුණු වන්නේ,
A - අහඹු රළු බව වැඩි කිරීම ය. B - දෘශ්‍ය ඝනත්වය වැඩි කිරීම ය.
C - සච්ඡිද්‍රතාව වැඩි කිරීම ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C සියල්ලම ය.

49. ආහාර සැකසීමේ දී ක්‍ෂුද්‍ර ජීවීන් භාවිතයෙන්, ආහාරවල
A - පෝෂණ තත්ත්වය වැඩි දියුණු වේ. B - ඉන්ද්‍රිය සංවේදීතාව (Sensory quality) වැඩි දියුණු වේ.
C - ආරක්ෂිත බව අඩු වේ. D - වයනය අඩු වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි.
(4) B හා C පමණි. (5) B හා D පමණි.

50. ආහාර සැකසීමේ දී සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) හා සල්ෆයිට්ස් ($SO_3^{-2}$) භාවිත කරනුයේ,
A - ප්‍රති ඔක්සිකාරක ලෙස ය. B - ප්‍රති ක්‍ෂුද්‍ර ජීවී කාරක ලෙස ය.
C - වර්ණ පරිසංරක්‍ෂක ලෙස ය. D - රසය වැඩි කරන ද්‍රව්‍ය ලෙස ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) B, C හා D පමණි.

☆☆☆

# කෘෂි විද්‍යාව II - පැය තුනයි

උපදෙස්:

වැදගත් :

- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යන කොටස් දෙකකින් යුක්ත වේ.
- A කොටස - ව්‍යුහගත රචනා
  සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු, මෙම පත්‍රයේ ම සපයන්න.
  ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.
- B කොටස - රචනා
  ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න.
  සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A සහ B කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ A කොටස උඩින් තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාර දෙන්න.
  ප්‍රශ්න පත්‍රයේ B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.
- A සහ B කොටස් දෙකට ම නියමිත කාලය පැය තුනකි.

## A කොටස - ව්‍යුහගත රචනා

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 10 කි.)

1. (A) බෝග වගාවට බලපාන ප්‍රධාන සාධකයක් වනුයේ පාංශු පරිසරය ය.

(i) පසේ භෂ්ම සංතෘප්තිය අර්ථ දක්වන්න.

............................................................

............................................................

(ii) පාංශු pH මත පහත සාධකවල ප්‍රධාන බලපෑම සඳහන් කරන්න.

1. ආනතිය

............................................................

............................................................

2. මාතෘ ද්‍රව්‍ය

............................................................

............................................................

3. වයනය

............................................................

............................................................

(iii) පාංශු සුසංහනය (compaction) අඩු කිරීමට යොදා ගන්නා ක්‍රම දෙකක් ලැයිස්තු ගත කරන්න.

1. ............................................................
2. ............................................................

(B) ගොවීන්ට තම ක්ෂේත්‍රවල සහතික කළ බිත්තර වී වගා කරන ලෙස කෘෂිකර්ම උපදේශක විසින් උපදෙස් දී ඇත.

(i) සහතික කළ බිත්තර වී භාවිතයේ ප්‍රධාන වාසි තුනක් ලැයිස්තු ගත කරන්න.

1. ............................................................
2. ............................................................
3. ............................................................

(ii) වී ශාකයේ ප්‍රධාන වර්ධන අවධි හතර සඳහන් කරන්න.

1. ............................................................
2. ............................................................
3. ............................................................
4. ............................................................

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(C) ගොවියෙක් තම ගොවිපලේ වවා ඇති පිපිඤ්ඤා වැල් මැලවී තිබෙනු නිරීක්ෂණය කළේය. පළමුව ඔහු විසින් පස නිරීක්ෂණය කරන ලදුව, ශාකවල සාමාන්‍ය වර්ධනයක් සඳහා අවශ්‍ය තරම් තෙතමනය පසේ ඇති බව දැනගන්නට ලැබුණි. ඉන්පසු ඔහු විසින් වැලෙහි අගට වන්නට කොටසක් කපන ලදී. වැලෙහි කැපුම් අග්‍ර දෙක තත්පර කිහිපයක් වෙන් කර තැබීමෙන් පසුව, එකිනෙක මත අතුල්ලා සෙමින් දෙපසට අදින ලදී. එවිට මෙම කැපුම් අග්‍ර දෙක අතර නානුමය කෙඳි (මකුළු දැල් වැනි) ඇදෙනු දක්නට ලැබුණි.

(i) මෙම රෝගයෙහි රෝග කාරකය කුමක් විය හැකි ද?

(ii) මෙම ගැටලුව පාලනය සඳහා රසායනික නොවන ක්‍රම තිබේ ද?


(iii) මෙවැනි රෝග දීර්ඝ කාලීනව පාලනය කිරීමට යොදා ගත හැකි හොඳම ක්‍රමය කුමක් ද?

(iv) මෙම රෝගය පාලනය කිරීම සඳහා ගොවියා රසායනික ද්‍රව්‍යයක් යොදා ගැනීමට අදහස් කරන්නේ නම්, නිෂ්පාදනයේ ලේබලයේ අඩංගු, ගොවියාගේ අවධානයට ලක් විය යුතු වැදගත් තොරතුරු තුනක් නම් කරන්න.

1. 
2. 
3. 

(v) භාවිත කළ රසායනික ද්‍රව්‍යය අඩංගුව තිබූ හිස් ඇසුරුම ගොවියා විසින් බැහැරලිය යුත්තේ කෙසේ ද?

(D) ප්‍රශ්න අංක (i) සිට (v) දක්වා පිළිතුරු සැපයීමට පහත රූප සටහන උපයෝගී කර ගන්න.



(i) ඉහත ව්‍යුහය නම් කරන්න.

(ii) මෙම ව්‍යුහය භාවිත කිරීමේ අරමුණ කුමක් ද?

(iii) අතු කැබලි ප්ලාස්ටික් බෑගය තුළ ස්ථාපනය කිරීමේදී, අතු කැබලිවල පත්‍ර බෑගයේ නොගෑවෙන සේ එය කිරීමට කෘෂිකර්ම ගුරුවරිය විසින් සිසුන්ට උපදෙස් දෙන ලදී. මෙම උපදේශයට හේතුව කුමක් ද?

(iv) අතු කැබැලිවල පත්‍ර අඩක් කපා ඇත්තේ ඇයි?

(v) මෙම ව්‍යුහය සඳහා විනිවිද පෙනෙන ප්ලාස්ටික් බෑගයක් යොදා ගැනීමට හේතුව කුමක් ද?

2. (A) කුකුළු මස් සඳහා ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සැලකිල්ලට ගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න

| සංසිද්ධිය | කුමන වක්‍රයට බලපෑම් ඇතිවේ ද? (ඉල්ලුම්/සැපයුම්) | සමතුලිත මිලට ඇති බලපෑම (ඉහළ යයි/පහළ යයි) |
|---|---|---|
| (i) කොලෙස්ටරෝල් පිළිබඳව සැලකිලිමත් වීම නිසා පාරිභෝගිකයන් ගව මස් වලින් කුකුළු මස් පරිභෝජනයට යොමු වේ. | | |
| (ii) කුකුළු ආහාර මිල පහත වැටේ. | | |
| (iii) වසංගතයක් නිසා කුකුළෝ විශාල වශයෙන් මිය යති. | | |
| (iv) ආගමික කරුණු නිසා බොහෝ කුකුළු මස් පාරිභෝගිකයින්, එළවලු පාරිභෝගිකයින් බවට හැරේ. | | |

(B) නිෂ්පාදන සාධක, ගලායන (flow) හා ගබඩා කළ හැකි (stock) සම්පත් ලෙස වර්ගීකරණය කර දක්වන්න.

ගලායන සම්පත්
1. ........................................
2. ........................................

ගබඩා කළ හැකි සම්පත්
1. ........................................
2. ........................................

(C) ආහාර සැකසීමේ දී විවිධ ආහාර ආකලන ද්‍රව්‍ය භාවිත කෙරේ.

(i) එකිනෙකට වෙනස් ආහාර ආකලන වර්ග හතරක් දක්වා එම එක් එක් වර්ගයට උදාහරණයක් බැගින් සඳහන් කරන්න.

| ආහාර ආකලන වර්ගය | උදාහරණය |
|---|---|
| 1. .................... | .................... |
| 2. .................... | .................... |
| 3. .................... | .................... |
| 4. .................... | .................... |

(ii) ආහාරවල ආහාර ආකලන අඩංගු කළ හැකි අනුමත සීමා ඇත. ආහාරවල ඉහත සීමා ඉක්මවා ආහාර ආකලන යෙදීමෙන් ඇතිවිය හැකි විපාක තුනක් ලැයිස්තු ගත කරන්න.
1. ........................................
2. ........................................
3. ........................................

(D) ක්ෂේත්‍ර චාරිකාවකදී ශිෂ්‍යයකු විසින් වල් පැළෑටි එකතු කර පහත පරිදි හඳුනා ගන්නා ලදී.






P - *Echinochola crusgalli*
Q - *Cyperus rotundus*
R - *Echhornia crassipes*
S - *Monochoria vaginalis*

ඉහත වල් පැළ පහත කාණ්ඩවලට වර්ගීකරණය කරන්න.

(i) නිදහසේ පාවෙන ජලජ වල් පැළෑටි ....................
(ii) වාර්ෂික තෘණ වල් පැළෑටි ....................
(iii) බහු වාර්ෂික පන් ....................
(iv) වාර්ෂික පළල් පත්‍ර වල් පැළෑටි ....................

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(E) ශාක අග්‍රස්ථයක අඩංගු වර්ධක ද්‍රව්‍ය පිළිබඳව සිදු කළ විද්‍යාගාර පරීක්ෂණයක ප්‍රතිඵල පහත රූපසටහන්වලින් දැක්වේ. එක් එක් පරීක්ෂණය සඳහා 'නිගමන' තීරුවේ හිස්තැන් පුරවන්න.

| පරීක්ෂණය | ප්‍රතිඵල | නිගමනය |
|---|---|---|
|   |   | (i) ........................................ ........................................ |
|   |   | (ii) ........................................ ........................................ |
|   |   | (iii) ........................................ ........................................ |
|   |   | (iv) ........................................ ........................................ |

(F) නාගරික ගෙවතු වගාවේ දී නිර්පාංශු වගා ක්‍රම ප්‍රචලිත වෙමින් පවතී. චක්‍රීය නොවන දිය වගා (Hydroponic) පද්ධති දෙකක් නම් කරන්න.

1. ........................................
2. ........................................

3. (A) ගොවිපළක කිරි එළදෙනකට පැටවෙක් උපන්නේ ය. ප්‍රථම දින තුන තුළ දී පැටියාට මවගෙන් කිරි උරා බීමට ඉඩ හැර ඉන්පසු ගොවියා විසින් කිරි දෙවීම අරඹන ලදී.

(i) පළමු දින තුනේ දී දෙනගේ බුරුල්ලෙන් ලැබෙන ස්‍රාවය නම් කරන්න.

........................................

........................................

(ii) ඉහත නම් කළ ස්‍රාවයේ ප්‍රධාන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

1. ........................................
2. ........................................
3. ........................................

(iii) මෙම ගොවියාට භාවිත කළ හැකි අතින් කිරි දෙවීමේ ක්‍රම දෙකක් නම් කරන්න.

1. ........................................
2. ........................................

(iv) ඉහළ ගුණාත්මයෙන් යුත් වැඩි කිරි අස්වැන්නක් ලබා ගැනීම සඳහා ගොවියා විසින් දෙනගෙන් කිරි දෙවීමට පෙර අනුගමනය කළ යුතු ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................

2. ..........................................................................

(v) පහත එක් එක් ප්‍රදේශයක නිදැලි ක්‍රමය යටතේ ඇති කිරීම සඳහා සුදුසු ගව වර්ගයක් (හෝ දෙමුහුමක්) බැගින් නිර්දේශ කරන්න.

1. කුරුණෑගල ..........................................................

2. අඹේවෙල ..........................................................

3. අනුරාධපුරය ..........................................................

4. කෑගල්ල ..........................................................

(vi) ගවයන්ට වැළඳෙන ආසාදිත රෝග දෙකක් හා එම එක් එක් රෝගයක රෝග කාරකයා නම් කරන්න.

| | රෝගය | රෝග කාරකයා |
|---|---|---|
| 1. | .............................. | .............................. |
| 2. | .............................. | .............................. |

(vii) ගොවියකු විසින් ඔහුගේ ගොවිපළට ඉහත රෝග ආසාදනය වීම වැළැක්වීමට ගත යුතු වැදගත් පියවර හතරක් නම් කරන්න.

1. ..........................................................................

2. ..........................................................................

3. ..........................................................................

4. ..........................................................................

(B) ලිඛිත ඉතිහාසයට අනුව ශ්‍රී ලංකාව අතීතයේ ස්වයංපෝෂිතව පැවති ඇත.

(i) අතීතයේ ස්වයංපෝෂිත ආර්ථිකයක් පැවති බවට සාක්ෂි දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................

2. ..........................................................................

(ii) අතීතයේ ස්වයංපෝෂිත ආර්ථිකයක් පැවතීමට හේතු දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................

2. ..........................................................................


(C) ශ්‍රී ලංකාව සතුව ප්‍රධාන දේශගුණික කලාප තුනක් ඇති අතර එම එක් එක් කලාපය කෘෂි පාරිසරික කලාපවලට බෙදා ඇත. මෙම කලාපීයකරණයේ ප්‍රතිලාභ තුනක් ලැයිස්තු ගත කරන්න.

1. ..........................................................................

2. ..........................................................................

3. ..........................................................................

4\. (A) මැදරට තෙත් කලාපයේ බෑවුම සහිත ඉඩමක් වගා කිරීමට අපේක්ෂා කළ ගොවියෙක් පහත දක්වා ඇති උපකරණය යොදා ගනිමින් ඉඩම මත රේඛා සටහන් කළේය. ඉන්පසු එම රේඛා දිගේ කාණු කපා බෑවුමේ හරස් අතට සී සෑමෙන් පසු පාත්ති සකස් කරන ලදී. තවද රසායනික පොහොර යෙදීමට පෙර ගොවියා විසින් පසට කාබනික පොහොර එකතු කරන ලදී.



(i) ඉහත උපකරණය නම් කරන්න.

..........................................................................

..........................................................................

(ii) මෙම උපකරණය යොදා ගනිමින් ගොවියා ලකුණු කළ රේඛා මොනවාද?

..........................................................................

..........................................................................

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



(iii) මෙම රේබා දිගේ කාණු කැපීමේ අරමුණ කුමක් ද?

..........................................................................................

..........................................................................................

(iv) ගොවියා බෑවුමට හරස්ව සී සෑම සිදු කළේ මන් ද?

..........................................................................................

..........................................................................................

(v) රසායන පොහොර යෙදීමට පෙර ගොවියා විසින් පසට කාබනික පොහොර එකතු කළේ මන් ද?

..........................................................................................

..........................................................................................

(vi) බහුලව භාවිත කරනු ලබන කාබනික පොහොර වර්ග **තුනක්** ලැයිස්තු ගත කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

(vii) ඒකාබද්ධ ශාක පෝෂක පද්ධති (IPNS) අර්ථ දක්වන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

(viii) පොහොර කාර්යක්ෂමතාව වැඩි කිරීමට යොදාගත හැකි උපාය මාර්ග **තුනක්** සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

(B) වියළි කලාපයේ මිදි වගා කරන ගොවියකුට සිය බෝගයට බිංදු ජල සම්පාදනය කරන ලෙස ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක විසින් උපදෙස් දෙන ලදී.

(i) ඉහත උපදේශයට ප්‍රධාන හේතුව කුමක් ද?

..........................................................................................

..........................................................................................


(ii) බිංදු ජල සම්පාදනයේදී සලකා බැලිය යුතු සාධක **තුනක්** ලැයිස්තු ගත කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

(C) ශ්‍රී ලංකාවේ පලතුරු හා එළවලුවල පසු අස්වනු හානි අධිකය. එළවලු හා පලතුරුවල පසු අස්වනු හානි අවම කර ගැනීම සඳහා යොදා ගත හැකි පෙර අස්වනු ක්‍රම **තුනක්** සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

(D) ප්‍රශ්න අංක (i) හා (ii) ට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන යොදා ගන්න.



*S* *T* *U*

(i) *S*, *T* හා *U* යන ස්වභාවික ප්‍රචාරක ව්‍යුහ නම් කරන්න.

*S.* ..............................................................................

*T.* ..............................................................................

*U.* ..............................................................................

(ii) ඉහත එක් එක් ප්‍රචාරක ව්‍යුහය සඳහා උදාහරණය බැගින් නම් කරන්න.

*S.* ..............................................................................

*T.* ..............................................................................

*U.* ..............................................................................

☆☆☆

## B කොටස - රචනා

❄ ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 15 කි.
❄ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.

---

1. (i) ආහාර ලේබල් කිරීමෙහි වැදගත්කම විස්තර කරන්න.
   (ii) බෑවුම් සහිත කෘෂිකාර්මික ඉඩම් සඳහා සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රම විස්තර කරන්න.
   (iii) විවිධ ආකාරයේ කෘෂි ව්‍යාපාර උදාහරණ සහිතව විස්තර කරන්න.

2. (i) කුඩා පරිමාණ බ්‍රොයිලර් කුකුළු ගොවිපළක් සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු විවිධ සාධක ලැයිස්තු ගත කරන්න. ඉහත සඳහන් සාධක, ගොවිපොළෙහි සාර්ථකත්වයට බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.
   (ii) කෘෂිකාර්මික ක්‍රියා, පාරිසරික විපර්යාසයන්ට බලපාන අයුරු විස්තර කරන්න.
   (iii) පාංශු හායනය වීමට බලපාන සාධක කවරේ ද? පාංශු හායනයේ අහිතකර බලපෑම් සඳහන් කරන්න.

3. (i) පැහැදිලිව නම් කළ රූපසටහන් ඇසුරෙන් එළදෙනකගේ හා කිකිළියකගේ ආහාර ජීර්ණ ක්‍රියාවලිය සංසන්දනාත්මකව දක්වන්න.
   (ii) කෘෂිකර්මයේදී රසායනික පොහොර අනිසි භාවිතයේ ගැටලු විස්තර කරන්න.
   (iii) උචිත රූපසටහන් ඇසුරෙන් පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.
   A - නොරිඩෝකෝ තවාන
   B - ඉස්සූ පාත්ති සහිත තවාන

4. (i) ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ජලය එසවීමේ ක්‍රම විස්තර කරන්න.
   (ii) සහතික බීජ නිෂ්පාදනයේ විවිධ පියවර නම් කරන්න. එහි එක් එක් පියවර විස්තර කරන්න.
   (iii) ජාන සම්පත් සංරක්ෂණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

5. (i) බෝගවලින් ඉහළ ගුණාත්මයෙන් යුත් වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා පාරිසරික තත්ත්ව පාලනය කිරීමේ වැදගත්කම විස්තර කරන්න.
   (ii) උත්ස්වේදනය පාලනය කළ යුත්තේ ඇයි? උත්ස්වේදනය පාලනය කරන ක්‍රම විස්තර කරන්න.
   (iii) උචිත රූපසටහන් ඇසුරෙන් කෘමි පළිබෝධයින්ගේ විවිධ වර්ගයේ මුඛ උපාංග විස්තර කරන්න.

6. (i) ක්ෂේත්‍රයේ වී බෝගය සංස්ථාපනය කරන විවිධ ක්‍රම විස්තර කරන්න.
   (ii) ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී සාම්ප්‍රදායික වගා පද්ධති විස්තර කරන්න.
   (iii) කෘෂිකාර්මික බෝග කෙරෙහි, දුර්වල ජලවහන තත්ත්වයන්ගේ අහිතකර බලපෑම සඳහන් කරන්න.

☆☆☆


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

LOL Book Store

# 25% OFF ALL BOOKS

**Including Exercise Books, CR Books, and B5 Books**



**ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්**

## ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 WWW.LOL.LK

071 777 4440 (WhatsApp)

**Cash On Delivery Available**

# ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

**SINHALA, ENGLISH & TAMIL MEDIUM**



# LOL BOOK STORE

**CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE**

**0717774440 (WHATSAPP)**

**WWW.LOL.LK**